# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2015 පෙබරවාරි මස 18 වන බදාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.51 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනුරාධ විමලරත්න | ජගත් අංගගේ | යූ.එල්.එන්.පී. උඩවෙල |
| අනුරුද්ධ ලේකම්ගේ | ජගත් කුමාර | යූ. ජෝර්ජ් පෙරේරා |
| අශෝක දයාරත්න | ජගත් පී. විතාන | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජනක දීපාල් වැලිවත්ත | රවී විජේසේකර |
| අමල් සිල්වා | ජයන්ත ද සිල්වා | රොජර් සෙනෙවිරත්න |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | නලින්ද ජයතිස්ස | රොයිස් විජිත |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | නව්සර් ෆව්සි | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| ඉන්දික බණ්ඩාර | නිමල් චන්ද්‍රරත්න | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| ඉසුර දේවප්‍රිය | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලයනල් ජයසිංහ |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | නිරෝෂා අතුකෝරල මැතිනිය | ලලන්ත ගුණසේකර |
| උදය ප්‍රභාත් ගම්මන්පිල | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | ලලිත් එල්ලාවල |
| උදාර රත්නායක | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | ලලිත් වර්ණකුමාර |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | පියල් නිශාන්ත | ලෙනාඩ් කරුණාරත්න |
| එම්.එස්.එම්. රහීම් | පී.ආර්.පී. අබේගුණවර්ධන | විජිත් ප්‍රියන්ත |
| එස්.එම්. මරික්කාර් | පී.ඩී. අබේරත්න | ශිරන්ත අමරසේකර |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය | ප්‍රදීප් උඳුගොඩ | ශ්‍රීනාත් පෙරේරා |
| එස්. කුහවරදන් | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සෙනල් වෙල්ගම |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සේනක දමයන්ත ද සිල්වා |
| කවින්ද හේෂාන් ජයවර්ධන | මහේෂ් අල්මේදා | සුනිල් ජයමිණි |
| කීර්ති කාරියවසම් | මංජුල බුද්ධදාස | සුනිල් වටගල |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | මෙරිල් පෙරේරා | සුමිත් ලාල් මැන්දිස් |
| ගුණසිරි ජයනාත් | මොහොමඩ් මුජිබුර් රහුමාන් | සුසිල් කිඳෙල්පිටිය |
| චන්දන ජයකොඩි | මොහොමඩ් ෆායිස් | හෙක්ටර් බෙත්මගේ |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අසෝක රන්වල | කොලන්නගේ වජිර පෙරේරා | රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් |
| ආනන්ද රංජිත් රූපසිංහ | කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | ලලිත් වනිගරත්න |
| ඇන්ටනී උපුල් රාජිත | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| උදේන විජේරත්න | නිමල් ආර්. පීරිස් | සලෝචන ගමගේ |
| උපාලි ගුණරත්න | නිරෝෂන් පාදුක්ක | සහන් ප්‍රදීප් |
| එඩ්වඩ් ගුණසේකර | මනෝ ගනේෂන් | සුසාර දිනාල් |
| කිත්සිරි කහටපිටිය | මහින්ද ජයසිංහ | හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය |
| කේ.ඩී. අරුණ දීපාල් | මොහොමඩ් ෆයිරූස් | |
| කේ.ඩී. ලාල්කාන්ත | රජිත හපුආරච්චිගේ | |

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදන

*I*

*"ගරු අන්දරගේ දොන් ගාමිණී තිලකසිරි මැතිතුමාව 2015.02.09 දින සිට බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*II*

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරවර කේ.සී. ලෝගේස්වරන් මැතිතුමා පිළිගැනීමේ උත්සවය හා හිටපු ගරු ආණ්ඩුකාරවර එස්. අලවි මව්ලානා මැතිතුමාට උපහාර පිදීම 2015 පෙබරවාරි මස 24 වන දින පෙ.ව. 9.15 ට කොළඹ 07, ශ්‍රී ලංකා පදනම ප්‍රධාන ශාලාවේදී පැවැත්වෙන බවත්, ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහභාගීත්වය ගෞරවයෙන් අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2014.10.03, 2014.10.07 හා 2014.11.18 දිනවල පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා [කාරක සභාවේ සභාපති] විසින් ඉදිරිපත් කරන ලදී.

අනතුරුව, 2015.02.06 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.42 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.26 ට යළිත් රැස්විය.***

## 03. පළාත් සභාවේ කටයුතු :

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා [සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්] විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*" අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

## 04. මෝටර් වාහන හිඟ ගාස්තුවලට අදාළ දඩ මුදල් සඳහා සහන ලබා දීමේ නියෝග :

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1892/35 දරන හා 2014.12.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ*[1] *පළ කරන ලද මෝටර් වාහන හිඟ ගාස්තුවලට අදාළ දඩ මුදල් සඳහා සහන ලබා දීමේ නියෝගයන් අනුමත කළ යුතුය." යන යෝජනාව නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, සභා සම්මත විය.*

## 05. රීති අංක 107 යටතේ යෝජනාව :

සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

---

[1] 2015.02.18 නිල වාර්තාව බලන්න.

**06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : උතුරු පළාත් සභාව සම්මත කරන ලද යෝජනාව හෙළා දකිමින් අප්‍රසාදය පළ කිරීම.**

සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*" උතුරු නැගෙනහිර දෙමළ ජාතිකයන් සමූල ඝාතනයන් සිදු වූ බවටත් උතුරට වෙනම ස්වයං පාලනයක් අවශ්‍ය බවටත් පසුගියදා උතුරු පළාත් සභාව විසින් යෝජනාවක් සම්මත කර එය ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලය වෙත ඉදිරිපත් කිරීම දැඩි ලෙස හෙලා දකින බස්නාහිර පළාතේ පළාත් සභාව එවැනි යෝජනාවක් සම්මත කිරීම පිළිබඳව අප්‍රසාදය පළ කර සිටින්නීය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.08 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

**07. කල් තැබීම :**

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 03.13 ට, 2015 මාර්තු මස 03 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.02.18
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/18
Minuts 2015.02.18 - Hansard Section